# 09 පන්සිල් රකිමු

01. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

කිසි විට සතකු නොමරමි මම නොමරවමි
වෙන අය මරන විට අනුමත නොම කරමි
කඩු දුනු මුගුරු මගෙ දෑතින් බැහැරලමි
සතුනට දයාබර හිතවත් අයෙක් වෙමි



02. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

නුදුන් දෙයක් සොර සිතකින් නොගන්නෙමි
අනුන් ලවා සොරකම් නොකරවන්නෙමි
හොරෙන් ගැනුම අනුමත නොම කරන්නෙමි
ලැබෙන්නකින් සතුටු ව දිවි ගෙවන්නෙමි

03. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි

වයසට නොගැළපෙන කම් සැප දුරු කරමි
කුමරුට කුමරියට හිමි බඹසර වෙසෙමි
වරදට පොළඹවන අය ඇසුරට නොයමි
සැම විට චරිතයෙහි පිවිතුරු බව රකිමි

04. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

බොරු බස් කියා කිසිවකු නොරවටන්නෙමි
කෙනෙකුන් ලවා බොරුවක් නොකියවන්නෙමි
බොරු බස් කීම අනුමත නොම කරන්නෙමි
සැබවක් වුව ද නිසි තැනක ම කියන්නෙමි

05. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

දුම්වැටි මත්වතුර මත්කුඩු නොබොන්නෙමි
අන් කිසිවකු හටත් ඒවා නොදෙන්නෙමි
බොන්නකු වෙතොත් අනුමත නොම කරන්නෙමි
අන් සැම ලෙසින් මත් මත පිටු දකින්නෙමි

පව හැරදමා කුසලට සිත යොමන්නෙමි
හැකි හැම දෙනාමත් පාපෙන් වළක්වමි
පව අතහැරීමෙහි අනුසස් කියන්නෙමි
මෙලෙසින් සැබෑ පිරිසිදු සිල් රකින්නෙමි

සිල්පද පහ ආරක්ෂා කළ යුතු අයුරු මෙම කවි පන්තියෙන් පැහැදිලි කොට ඇත. පන්සිල් සුරැකීමේ දී සෑම සිල්පදයක් ම අංශ තුනකින් ආරක්ෂා කළ යුතු ය. එබැවින් එම සීලය **ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය** යනුවෙන් හැඳින්වේ. එම අංග තුන නම්,

1. තමා වරදින් වැළකීම
2. අන් අය ලවා වැරැදි නොකරවීම
3. අන් අය කරන වැරැදි අනුමත නොකිරීම (වැරැදි කරන්නන් සඳහා අනුබල නොදීම) වශයෙනි.

ශීලය දෙයාකාර ය. ඉහත දක්වන ලද්දේ වැළකීම හෙවත් විරතියයි. එනම් නොකළ යුතු  දේවල් ය. ශීලය සම්පූර්ණ වීමට කළ යුතු දේවල් ද බුදු දහම අපට පෙන්වා දෙයි. චාරිත්‍ර හෙවත් සමාදාන යනුවෙන් හැඳින්වෙන්නේ ඒවා ය. එනම්,

1. තමා යහපතෙහි යෙදීම
2. අන් අය ද යහපත් ක්‍රියාවන්ට යොමු කරවීම
3. අනුන් කරන යහපත් ක්‍රියා අගය කිරීම යනුවෙනි.

පළමු සිල් පදය ගත් විට තමා ප්‍රාණඝාතයෙන් වැළකීම ප්‍රමාණවත් නොවේ. අන් අය ලවා ද ප්‍රාණඝාතය සිදු නොකළ යුතු ය. ප්‍රාණඝාතයෙහි යෙදෙන්නන්ට අනුබල දීම හෝ එම ක්‍රියාව අනුමත කිරීම හෝ නොකළ යුතු ය. ප්‍රාණඝාතයෙන් වැළකීම මෙන් ම සියලු සත්ත්වයින්ට කරුණාවෙන් දයාවෙන් මෛත්‍රී සිතින් යුතු ව කටයුතු කිරීම, අන් අය ලවා ද එසේ කරවීම මෙන් ම සතුන්ගේ යහපත වෙනුවෙන් කරනු ලබන ක්‍රියා අගය කිරීම ද සිදු විය යුතු ය. දෙවන ශික්ෂා පදය සැලකූ විට තමා සොරකම් නොකිරීම, අන් අය ලවා නොකරවීම මෙන් ම අනුබල නොදීම ද කළ යුතු ය. එම ශික්ෂා පදයෙහි සමාදානය ලෙස අදහස් කරන්නේ අන් අයගේ දේපොළ ආරක්ෂා කිරීම, ඒ සඳහා අන් අය යොමු කරවීම ද ආරක්ෂා කිරීමට අනුබල දීම ද වේ. ඒ අනුව සිල් පද පහ තුළ ම වැළකීමේ අංශයක් මෙන් ම හැසිරීමේ අංශයක් ද ඇත. පංචශීලය නිසි පරිදි ආරක්ෂා කිරීම යනු මෙම දෙඅංශයෙන් ම කටයුතු කිරීම බව අප තේරුම් ගත යුතු ය.

## සාරාංශය



වැරැදි නොකොට ඉන් වැළකීමෙන් පමණක් සිල්වතකු බවට පත් විය නොහැකි ය. ඒ නිසා සිල් සමාදන් වීමෙන් අනතුරුව පිළිපැදිය යුතු නිවැරැදි හැසිරීම් ද තිබේ.

පරපණ නැසීම, සොරකම් කිරීම, වැරැදි කම්සුව සෙවීම, බොරු බස් කීම, මත් ද්‍රව්‍ය භාවිත කිරීම වැරැද්දක් මෙන් ම අන්‍යයන් ලවා කරවීම ද වැරැද්දක් වේ. එපමණක් නොව එම වැරැදි ක්‍රියා අනුමත කිරීම හා ඒ සඳහා අනුබල දීම ද වැරැද්දකි.

තමා විසින් ම වැරැදි කිරීමත්, අන්‍යයන් මඟින් කරවීමත්, අන්‍යයන් විසින් කරන වැරැදි අනුමත කිරීම හා ඒවාට අනුබල දීමත් යන කරුණුවලින් වැළකී කටයුතු කිරීම ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය ලෙස හැඳින්වේ.

## ක්‍රියාකාරකම



1. පංචශීලයට අයත් ශික්ෂා පද ලියා ඒවායේ සරල අදහස ලියන්න.
2. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය යනු කුමක් ද?
3. විරමනය හා සමාදනය එක් සිල් පදයක් ඇසුරින් පැහැදිලි කරන්න.

## පැවරුම



ඔබ විසින් සිදු කරන ලද යහපත් ක්‍රියා ලැයිස්තු ගත කරන්න.

## පුහුණුවට



මෙහි දැක්වෙන කවි කටපාඩම් කර තාලයට ගායනා කරන්න.